# තොරතුරු පනත හා වත්කම් බැරකම් පනත




File Photo

මා වෙත වැඩිපුර එවා ඇති රුපියල් 5500ක මුදල චෙක්පත මුදල්වීමෙන් පසු ඔබ වෙත ආපසු එවනු ලැබේ.

එම මැතිවරණ කොමසාරිස්වරයාම (දයානන්ද දිසානායක) මා සම්බන්ධයෙන් අනුගමනය කළ ප්‍රතිපත්තියට වෙනස්ව නීතියට පටහැනි ප්‍රතිපත්තියක් ඊට මාස හතරකට පසු අනුගමනය කර තිබෙන ආකාරය පෙන්නුම් කරන නිදර්ශනයක් මෙසේය. මැතිවරණ කොමසාරිස්වරයා ඉල්ලුම්කරුට සිය පිළිතුරු ලිපිය එවා තිබෙන්නේ 2005.11.01 වන දිනයේදීය.

ජනාධිපති

අපේ රටේ යල්පැනගිය අවුල්සහගත නීති තිබෙනවා සේ ම ඉදිරිගාමී හොඳ නීතිද තිබෙන්නේය. එහෙත් බොහෝ විට ඉදිරිගාමී හොඳ නීති තිබෙන්නේ ක්‍රියාත්මක නොවන තත්ත්වයකය. නැත්නම් බකල ගසන තත්ත්වයකය. මහජනයාට තොරතුරු ලබාගැනීමේ අයිතිය ලබාදීම සඳහා යහපාලන ආණ්ඩුව නීතිගත කර තිබෙන තොරතුරු පනත රටට අලුතෙන්ම ලැබී තිබෙන ඉතාමත් ඉදිරිගාමී යහපත් නීතියක් ලෙස සැලකිය හැකිය. මෙම තොරතුරු පනත කරළියට එන්නට පෙරද මහජන නියෝජිතයන්ගේ හා ප්‍රධාන රාජ්‍ය නිලධාරීන්ගේ වත්කම් හා බැරකම් පිළිබඳ තොරතුරු මහජනයාට ලබාගත හැකි නීතියක් තිබුණි. වත්කම් බැරකම් නීතිය වශයෙන් සැලකෙන එම නීතියද වත්කම් බැරකම් විෂයෙහි මහජනයාට තොරතුරු ලබාගැනීමට තිබුණු නීතියක් ලෙස සැලකිය හැකිය. තොරතුරු පනතින් බොහෝවිට ජනතාවට ලබාගත හැකිවනු ඇත්තේ රාජ්‍ය ආයතනවල ක්‍රියාකාරීත්වයට අදාළ තොරතුරු පමණය. එම රාජ්‍ය ආයතනවල ප්‍රධාන නිලධාරීන්ගේ වත්කම් බැරකම් තොරතුරු පනතින් ලබාගත හැකිද යන්න සැකසහිතය. හේතුව තොරතුරු ලබාගැනීම සඳහා නොව නීතියක් තිබීමත් එම නෛතික අර්ථයෙන් තොරතුරු පනතට වඩා බලවත් වන නිසාත්ය.

තොරතුරු පනත නීතිගත කරන අවස්ථාවේදී ම වත්කම් බැරකම් විෂයට අදාළව මහජනයාට තොරතුරු ලබාගැනීමට තිබුණු නීතිය ලෙස සැලකිය හැකි වත්කම් බැරකම් නීතියද විධිමත් කොට එම නීතියද මනා ලෙස ක්‍රියාත්මක වන තත්ත්වයක් ඇති කළේ නම් ඉන් රටට සිදුවන්නට තිබුණු යහපත අතිවිශාලය. තොරතුරු පනතක අවශ්‍යතාව ලංකාවේ සාකච්ඡාවට ලක්වූ මුල්ම අවස්ථාවේදී පවා මා සිටියේ ඒ ගැන ප්‍රශ්න කරන තැනකය. මාගේ තර්කය වූයේ වත්කම් බැරකම් නීතිය ඉතාමත් වැදගත් විෂයයකට අදාළව මහජනයාට තොරතුරු ලබාගැනීමේ අයිතිය ලබාදෙන නීතියක් වන නිසාත්, එය තිබෙන්නේ හොඳින් ක්‍රියාත්මක නොවන තත්ත්වයක නිසාත් ඇති කරගන්නට යන තොරතුරු පනතටත් එම කල දසාවම ලැබිය හැකි නිසා තොරතුරු පනතක් ඇතිකර ගැනීමට දරන උත්සාහයන් තුළ වත්කම් බැරකම් නීතියද විධිමත් කොට එය ක්‍රියාකාරී තත්ත්වයකට ගැනීමේ උත්සාහයක් තිබිය යුතු බවය. එහෙත් මගේ පුදුමයට මෙන් තොරතුරු පනතක් ඇතිකර ගැනීමට උනන්දුවක් දැක්වූ අය මොන මොන හේතු නිසා හෝ වත්කම් බැරකම් නීතිය විධිමත් කරගැනීමේ අවශ්‍යතාව ගැන උනන්දුවක් නොදැක්වීය.

වත්කම් බැරකම් නීතිය

දැන් නීතිගත කර තිබෙන තොරතුරු පනත හැදෙමින් තිබෙන අවස්ථාවේදී ඒ ගැන සාකච්ඡා කෙරුණු නිල පෝරම දෙකකදී ද තොරතුරු පනතක් හදන මේ අවස්ථාවේදී ද තවත් තොරතුරු පනතක් ලෙස සැලකිය හැකි වත්කම් බැරකම් නීතිය ද විධිමත් නොකරන්නේ ඇයි ද කියන ප්‍රශ්නය මතු කරනු ලැබූවත් එම සභා දෙක මෙහෙයූවන් ඒ ගැන උනන්දුවක් දැක්වූ බවක් පෙනෙන්නට නොතිබුණි.

වත්කම් බැරකම් නීතිය දූෂණය පිළිබඳ විෂයේ දී අයථා ලෙස වත්කම් රැස්කර ගන්නන් සියුම් ලෙස කොටුකර ගැනීම පිණිස සකස් කෙරුණු නීතියක් ලෙස සැලකිය යුතුය. ලබාදෙන වත්කම් බැරකම් ප්‍රකාශයක් එම ප්‍රකාශය ලබාදෙන තැනැත්තා කෙරෙහි ඔහු ජීවත් වන තාක් බලපායි. එහි බරපතළ වරදක් ඇතොත් ඔහු කවදා හෝ නීතියට කොටුවිය හැකිය. එහිදී වත්කම් බැරකම් ප්‍රකාශ කරන්නන් තමන්ගේ හා තම පවුලේ අයගේ සැබෑ වත්කම් හෙළිදරව් කළ යුතුය. වත්කම් සැඟවීම හා කරුණු විකෘති කිරීම දඬුවම් ලැබිය හැකි වරදකි. මෙම නීතිය අනුව අයථා ලෙස ධනය රැස්කරගෙන ඇත්නම් ඒ ධනය රාජසන්තක කළ හැකිය. මෙම නීතිය අනුව වත්කම් බැරකම් ප්‍රකාශ කරන්නන්ගේ ප්‍රකාශන පරීක්ෂා කිරීමේ බලය ලබාදී තිබෙන්නේ මහජනයාටය. මෙය ලංකාව නිර්මාණය කළ නීතියක් නොව ලෝකයේ බොහෝ රටවල ක්‍රියාත්මක වන නීතියකි.

මෙම නීතිය යටතේ වත්කම් බැරකම් ප්‍රකාශ කිරීමට බැඳී සිටින ඕනෑම පුද්ගලයකුගේ වත්කම් බැරකම් ප්‍රකාශනවල සහතික පිටපත් ඒ ගැන උනන්දුවක් දක්වන ඕනෑම පුද්ගලයකුට නියම කර තිබෙන ගාස්තුව ගෙවා ලබාගත හැකිය. අදාළ මිල ගෙවා ඉල්ලා සිටින වත්කම් බැරකම් ප්‍රකාශවල සහතික පිටපත් ඉල්ලුම්කරුට ලබාදීමට බලධාරියා බැඳී සිටින්නේය. මෙම නීතිය ක්‍රියාත්මකවීම වළකන සම්බාධකයක් ලෙස ක්‍රියාකරන්නේ එම බලධාරීන්ය.

බලධාරීන්ගේ කෙරුවාව

දේශපාලනඥයන්ගේ හෝ රාජ්‍ය නිලධාරියකුගේ වත්කම් බැරකම් ප්‍රකාශවල පිටපත් ලබාගැනීම ඉතා දුෂ්කර දෙයක් බවට පත්කිරීමට සමහර බලධාරීන් සමත් වී තිබේ. ඒ සඳහා සමහර බලධාරීන් හා උසස් රාජ්‍ය නිලධාරීන් අතර පොදු එකඟත්වයක් තිබෙන බවද පෙනෙන්නට තිබේ. උසස් රාජ්‍ය නිලධාරීන් සාමාන්‍යයෙන් රාජ්‍ය  නිලධාරීන්ගේ වත්කම් බැරකම් ප්‍රකාශ මහජනයා අතට පත්වනවා දකින්නට අකමැතිය. ඒ නීතිය තමන්ටත් අදාළ බව එසේ කරන රාජ්ජ්‍ය නිලධාරීන් දන්නෙහිය. ඒ නිසා සමහර බලධාරීන් කරන්නේ වත්කම් බැරකම් ප්‍රකාශ මහජනයා ඉල්ලා සිටින අවස්ථාවලදී මොන ක්‍රමයකට හෝ ඉල්ලුම්කරුගේ ඉල්ලීම ඉටු නොකොට මගහරින ප්‍රතිපත්තියක් අනුගමනය කිරීමය.

වත්කම් බැරකම් නීතිය ඵලදායී ලෙස ක්‍රියාත්මක වන තත්ත්වයක් ඇතිකර ගැනීම සඳහා අවුරුදු 20කට ආසන්න කාලයක් තිස්සේ කරන ලද විවිධ දේවල් පිළිබඳව මම මීට පෙර ලියා ඇත්තෙමි. මෙහි දක්වන නිදර්ශනය මේ මෑත දිනකදී රාවය පාඨකයකුගෙන් ලැබුණු පැමිණිල්ලකි. එම පැමිණිලිකරු විසින් මා වෙත ලබාදෙන ලද ලිපිගොනුවට අනුව ඔහු ගාල්ලේ සවුත්ලන්ඩ්ස් විද්‍යාලයේ විදුහල්පතිනියගේ (ශාන්ති වික්‍රමතුංග සෙනෙවිරත්නගේ) වත්කම් බැරකම් ප්‍රකාශන අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයාගෙන් විධිමත් ලෙස ඉල්ලුම් කර තිබෙනුයේ ලියාපදිංචි තැපෑලෙනි. එම ලිපියට කිසිදු පිළිතුරක් නොලැබුණු විට ඒ ගැන නැවත සිහිකැඳවීමේ ලිපියක් යවා තිබෙන්නේ 2016 පෙබරවාරි 29 වැනිදාය. ඔහුට පිළිතුරු ලිපියක් වෙනුවට අධ්‍යාපන ලේකම්වරයා වෙනුවෙන් වැඩබලන අතිරේක ලේකම්වරියක් රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ වෙත උපදෙස් ඉල්ලා යවන ලද ලිපියක පිටපතක් එවා තිබේ. කිසියම් පුද්ගලයකු (එහි ඔහුගේ නම සඳහන් කර තිබේ.) සවුත්ලන්ඩ් විද්‍යාලයේ විදුහල්පතිනියගේ වත්කම් බැරකම් ප්‍රකාශ ලබාගැනීම සඳහා ඉල්ලුම් කර තිබෙන බවත්, මීට පෙර අධ්‍යාපන අමාත්‍යාංශයේ බාහිර පුද්ගලයන් සඳහා වත්කම් බැරකම් ප්‍රකාශ ලබාදී ඇති බවට වාර්තා නොවන නිසාත් ඒ සඳහා අය කළයුතු ගාස්තු පිළිබඳව උපදෙස් ලබාදෙන ලෙස එම ලිපියෙන් ඉල්ලා තිබුණි.

එම ලිපිය අනුව පෙනෙන්නේ මීට පෙර මොනම පුද්ගලයකුටවත් අධ්‍යාපන අමාත්‍යාංශයට වත්කම් බැරකම් ප්‍රකාශ දී නැති බවය. සංශෝධිත වත්කම් බැරකම් නීතිය (1988 අංක 74 දරන වත්කම් බැරකම් ප්‍රකාශ කිරීමේ (සංශෝධිත) පනත) නීතිගත කොට එය කතානායකවරයාගේ සහතිකය දී තිබෙන්නේ 1988 දෙසැම්බර් 17 වැනිදාය. මාණ්ඩලික තත්ත්වයේ නිලධාරීන් විශාල සංඛ්‍යාකවක් වැඩ කරන (විදුහල්පතිවරුන් 8000කට ආසන්න පිරිසක් වැඩ කරන) අමාත්‍යාංශයක අවුරුදු 27ක් තරම් කාලයක් තුළ වත්කම් බැරකම් ප්‍රකාශ ලබාගැනීම සඳහා මොනම පුද්ගලයකුවත් ඉල්ලුම් කර නැති බවය. ඉල්ලුම් නොකිරීමේ කතාවේ සත්‍යයක් ඇතැයි මම නොසිතමි. මීට පෙර මොනම පුද්ගලයකුටවත් වත්කම් බැරකම් ප්‍රකාශ ලබාදී නැතැයි කියන කතාව සත්‍යයක් විය හැකිය. අධ්‍යාපන බලධාරීන් බහිරවයකු රකිනා ලෙස මෙම වත්කම් බැරකම් ප්‍රකාශ මහජනයා අතට පත්වීම වළකන ප්‍රතිපත්තියක් කාලයක් තිස්සේ පවත්වාගෙන ගොස් ඇති බව ඒ මගින් තේරුම්ගත හැකිය.

ඉහත සඳහන් අධ්‍යාපන ලේකම්වරිය අධ්‍යාපන ලේකම්වරයා වෙනුවෙන් වත්කම් බැරකම් ප්‍රකාශ ලබාදීම වෙනුවෙන් අයකරගත යුතු ගාස්තු පිළිබඳව රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ වරයාගෙන් උපදෙස් ඉල්ලීමක් කර ඇතත්, එවැනි අවස්ථාවකදී අයකරගත යුතු ගාස්තු පිළිබඳව නිකුත් කළ චක්‍රලේඛනයක් (අංක 650/7) විශේෂ ගැසට් පත්‍රයක් වශයෙන් 1991 පෙබරවාරි 02 දින නිකුත් කර තිබේ. ඒ අනුව සහතික පිටපතක් ලබාදීම සඳහා අයකරගත යුතු ගාස්තුව රුපියල් 750කි.

බහිරව ප්‍රතිපත්තිය

වැඩ බලන අතිරේක ලේකම්වරියගේ එම ලිපියට 2016.03.11 වැනි දින පිළිතුරක් යවන ඉල්ලුම්කරු කියා ඇත්තේ තමන්ට එවන ලද ලිපියේ දිනය වශයෙන් යොදා ඇත්තේ 2016.02.29 දිනය වුවත් තමන්ට එම ලිපිය ලැබුණේ 2016.03.10 වන දිනයේ බවය. තවදුරටත් ඔහු කියා තිබෙන්නේ ඊට පෙර දිනයේදී ඔහු අධ්‍යාපන අමාත්‍යාංශයට ගොස් ඇය හමුවී මේ ප්‍රශ්නය ගැන සාකච්ඡා කළ බවත්, එහිදී එතුමියගෙන් ලැබුණු ප්‍රතිචාරය යහපත් නොවන බවත්ය. ඉල්ලුම්කරු තමන්ගේ එම පිළිතුරු ලිපිය සමග ඉල්ලා සිටින වත්කම් බැරකම් ප්‍රකාශන සඳහා රුපියල් 2700ක මුදල් ඇණවුමක්ද (M3005915) අධ්‍යාපන ලේකම්වරයා වෙත යැව්වේය. දැන් මාස පහකට වැඩි කාලයක් ගෙවී ඇතත්, ඔහු ඉල්ලා සිටි වත්කම් බැරකම් ප්‍රකාශන හෝ ඒවා නොදෙන්නේ නම් ඔහු යවන ලද මුදල් හෝ ඔහුට ආපසු ලබාදී නැත.

වත්කම් බැරකම් නීතිය බලගන්වන එන්ජිම ලෙස ක්‍රියාකරන්නේ මහජනයාය. එම එන්ජිම ක්‍රියාත්මක වන්නේ මහජනයා වත්කම් බැරකම් ප්‍රකාශ පරීක්ෂාවට ලක්කරන තරමටය. වත්කම් බැරකම් විෂයේදී සාමාන්‍යයෙන් සිදුවන්නේ වත්කම් බැරකම් නීතිය අනුව වත්කම් බැරකම් ප්‍රකාශ කළයුතු අය ලබාදෙන වත්කම් බැරකම් ප්‍රකාශ අදාළ බලධාරියා බාරේ යතුරු දමන ලද අල්මාරියක සුරක්ෂිතව ගබඩා කොට තැබීමය. ඉතාමත් කලාතුරකින් අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිසමේ හෝ දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුවේ ඉල්ලීමක් අනුව වත්කම් බැරකම් ප්‍රකාශයන් පරීක්ෂාවට ලක්විය හැකිය. එහෙත් එවැන්නක් සිදුවන්නේ ඉතාමත් කලාතුරකිනි. මහජනයා ඒවා පරීක්ෂාවට ලක් නොකරන්නේ නම් වත්කම් බැරකම් නීතිය පවතිනු ඇත්තේ ක්‍රියාවිරහිත තත්ත්වයකය. වත්කම් බැරකම් ප්‍රකාශ මජහනයා ඉල්ලා සිටින අවස්ථාවලදී මහජනයාට ඒවා ලබා නොදීම මගින් බලධාරීන් කරන්නේ එම නීතියේ එන්ජිම ක්‍රියා විරහිත තත්ත්වයක තැබීමය. අධ්‍යාපන ලේකම්වරයා මෙහිදී කර තිබෙන්නේද ඒ දේය.

එහෙත් මෙය අධ්‍යාපන ලේකම්වරයාට සීමාවූ තත්ත්වයක් නොවන බව කිවයුතුය. බලධාරීන් ඒ සඳහා අනුගමනය කරන ප්‍රතිපත්තිය එක සමාන නැත. සමහර බලධාරීන්ට නීතිය පෙන්වාදීමෙන් පසු ඒ සම්බන්ධයෙන් පවත්වාගෙන යන බහිරව ප්‍රතිපත්තියෙන් ඉවත් වන අවස්ථා පවතී. කොතරම් නීතිය පැහැදිලි කර දුන්නද එම ප්‍රතිපත්තියෙන් ඉවත් නොවන අවස්ථාද පවතී.

වෙනත් නිදර්ශන

එක්දාස් නවසිය අනූ ගණන් මුලදී පාර්ලිමේන්තුවේ ලේකම්වරයා පවත්වාගෙන ගිය දැඩි ප්‍රතිපත්තිය ඉදිරියේ මා කරන ලද අත්හදා බැලීමක් ගැන මා මීට පෙර ලියා ඇත්තෙමි. කේ.බී. රත්නායක මහතා

කතානායක ධුරයට පැමිණි පසු මා කතානායක අමතා නීතියද පැහැදිලි කරදෙමින් විස්තරාත්මක ලිපියක් ලියා යැව්වෙමි. ඔහු වහාම ඊට ප්‍රතිචාර දැක්වූයේය. ඊට එවන පිළිතුරු ලිපියක් මගින් කරුණු පැහැදිලි කර එවීම ගැන ස්තුතිය පළකරමින් වත්කම් බැරකම් ප්‍රකාශ කර තිබෙන මන්ත්‍රීවරුන්ගේ නාමලේඛනයක් ද එවමින් ඒ ඕනෑම කෙනෙකුගේ වත්කම් බැරකම් ප්‍රකාශ පාර්ලිමේන්තු ලේකම්වරයාගෙන් ලබාගන්නා ලෙසත් ඒ සඳහා තමන් ඔහුට උපදෙස් දෙන ලද බවත් මා වෙත දන්වා එවීය.

2005.03.29 වන දින වන විට පාර්ලිමේන්තුවේ මහ ලේකම් වෙනුවෙන් නියෝජනය මහ ලේකම් ධම්මික දිසානායක මහතා මා වෙත කරන ලද දැනුම්දීමක් මෙසේය.

පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ වත්කම්

බැරකම් ප්‍රකාශවල පිටපත් ලබාගැනීම

උක්ත කරුණට අදාලව ඔබගේ 2005.03.22 සහ 2005.03.28 දරන ලිපිවලට වැඩිමනත් වශයෙනි.

උක්ත වත්කම් බැරකම් ප්‍රකාශවල පිටපත් අදාළ ගාස්තුවට යටත්ව ඔබ වෙත ලබාදෙන ලෙස ගරු කතානායකතුමා විසින් මා වෙත නියෝග කොට ඇත.

එබැවින් රුපියල් 1500ක මුදලක් අයකැමි වෙත ගෙවා අදාළ ලදුපත මා වෙත ඉදිරිපත් කොට ඔබම පෞද්ගලිකව පැමිණ මා හමුවී ඉහත ප්‍රකාශවල පිටපත් ලබාගත යුතු බව කාරුණිකව දන්වමි.

ජනාධිපති ලේකම් (කුසුම්සිරි බාලපටබැඳි) මගින් ඇමති මණ්ඩල සාමාජිකයන්ගේ වත්කම් බැරකම් ප්‍රකාශ ලබාගැනීමට දරන ලද උත්සාහය සාර්ථක වූයේ නැත. මා ඔහු තනතුරේ සිටින තාක් කල් හැම මාස තුනකට වරක්ම සිහිකැඳවීම් යවනු ලැබුවත් ඔහු තමන් පවත්වාගෙන ගිය රළු ප්‍රතිපත්තිය අත්හැරියේ නැත.

මැතිවරණ දෙපාර්තමේන්තුවේ දොරටු විවෘත කරවා ගැනීම සඳහා මා දරන ලද උත්සාහය සාර්ථක විය. පහත පළවනුයේ මැතිවරණ කොමසාරිස් දයානන්ද දිසානායක මහතා 2005.07.26 වැනි දින මා වෙත එවන ලද පිළිතුරු ලිපියයි.

දේශපාලන පක්ෂවල නිලධාරී මණ්ඩල

සාමාජිකයන්ගේ වත්කම් බැරකම් ප්‍රකාශවල පිටපත් ලබාගැනීම

උක්ත මැයෙන් මා අමතන ලද ඔබේ 2005.07.12 දිනැති ලිපිය සම්බන්ධයෙනි.

පහත නම් සඳහන් මහත්ම මහත්මීන් විසින් මා වෙත ඉදිරිපත් කරන ලද වත්කම් බැරකම් ප්‍රකාශ 06ක පිටපත් මෙයට ඇතුළත්ව ඇත.

ශ්‍රී ලංකා නිදහස් පක්ෂය - චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මහත්මිය.

එක්සත් ජාතික පක්ෂය - රනිල් වික්‍රමසිංහ මහතා

ජනතා විමුක්ති පෙරමුණ - එම්. ටිල්වින් ද සිල්වා මහතා

විමල් වීරවංශ මහතා, එම්. නන්දන ගුණතිලක මහතා, ජී. කුලරත්න මහතා.

අධිකරණ හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශයේ ලේකම්ගේ 1990.03.12 දිනැති චක්‍ර ලේඛන ලිපිය අනුව මෙම වත්කම් බැරකම් ප්‍රකාශයක සහතික පිටපතක් සඳහා රුපියල් 750ක ගාස්තුවක් අය කළ යුතුවේ. ඒ අනුව ඉහත ප්‍රකාශ 06හි පිටපත් සඳහා අය කළ යුතු මුදල රුපියල් 4500ක් පමණය.

ඔබ විසින් අංක 307901ක් හා 2005.07.12 දිනැති චෙක්පත මගින් එවන ලද රුපියල් 10,000 මුදල සඳහා නිකුත් කරන ලද T 20 871403 හා 2005.07.26 දිනැති නිල රිසිට් පත මේ සමග එවමි.

මා වෙත වැඩිපුර එවා ඇති රුපියල් 5500ක මුදල චෙක්පත මුදල්වීමෙන් පසු ඔබ වෙත ආපසු එවනු ලැබේ.

එම මැතිවරණ කොමසාරිස්වරයාම (දයානන්ද දිසානායක) මා සම්බන්ධයෙන් අනුගමනය කළ ප්‍රතිපත්තියට වෙනස්ව නීතියට පටහැනි ප්‍රතිපත්තියක් ඊට මාස හතරකට පසු අනුගමනය කර තිබෙන ආකාරය පෙන්නුම් කරන නිදර්ශනයක් මෙසේය. මැතිවරණ කොමසාරිස්වරයා ඉල්ලුම්කරුට සිය පිළිතුරු ලිපිය එවා තිබෙන්නේ 2005.11.01 වන දිනයේදීය.

ජනාධිපති අපේක්ෂකයන්ගේ

වත්කම් බැරකම් පිටපත් ලබාගැනීම

උක්ත හිසින් යුතුව එවන ලද ඔබගේ 2005.10.25 දිනැති ලිපිය සම්බන්ධවයි.

1978 අංක 74 දරන වත්කම් බැරකම් ප්‍රකාශ කිරීමේ (සංශෝධන) පනතේ 7 වැනි වගන්තිය අනුව කිසියම් පුද්ගලයකු විසින් භාරදෙන ලද වත්කම් සහ බැරකම් ප්‍රකාශයක් මෙම පනත යටතේ නඩු පැවරීමේ කාර්ය සඳහා හෝ මේ පනතේ විධි විධාන බලාත්මක කිරීමේ කාර්යය සඳහා හෝ හැර වෙනත් කටයුත්තක් සඳහා යම් තැනැත්තකු විසින් කරනු ලබන ඉල්ලීමක් මත නිකුත් කළ නොහැකි බව කාරුණිකව දන්වමි.

එබැවින් ඔබ විසින් මා වෙත එවන ලද 2005.10.25 දිනැති මහජන බැංකුව මහරගම ශාඛාවේ අංක 331920 දරන රුපියල් 1500ක් වටිනා චෙක්පත අවශ්‍ය කටයුතු සඳහා මේ සමග එවමි.

එම ඉල්ලුම්කරු මැතිවරණ කොමසාරිස්වරයාගෙන් ලැබුණු එම පිළිතුර මත පදනම් වී අධිකරණය ඉදිරියට ගියේ නම් ඔහු සාධාරණ නඩු විභාගයක් ලබාගැනීමට සමත් වී නම් මැතිවරණ කොමසාරිස්වරයා කර තිබෙන එම නීති උල්ලංඝනය ගැන මැතිවරණ කොමසාරිස්වරයා බරපතළ දෝෂාරෝපණයකට ලක්වන්නට ඉඩ තිබුණි.

පහත පළවන පිළිතුරු ලිපිය විදුහල්පතිවරයකුගේ වත්කම් බැරකම් ප්‍රකාශ ඉල්ලා අධ්‍යාපන ලේකම්වරයා වෙත යවන ලද ලිපියකට අධ්‍යාපන ලේකම්වරයා වෙනුවෙන් එන්.කේ. ගුණවර්ධන (ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් පාලන) විසින් 2008.02.19 වැනි දින එවන ලද පිළිතුරු ලිපියකි.)

ඔබේ 2008.01.03 වැනි දිනැති ලිපිය හා බැඳේ. එම ලිපියේ ඉල්ලා ඇති වත්කම් බැරකම් ප්‍රකාශනය රහසිගතව තබාගත යුතු බැවින් මෙවැනි පෞද්ගලික ඉල්ලීමකට ඉඩදිය නොහැකි බව කරුණාවෙන් දැනුම් දෙමි.

හෙනහුරු දශාව

වත්කම් බැරකම් නීතියට ලබා තිබෙන සෙනසුරු දශාව තොරතුරු පනතටද ඇතිවිය හැකිය. නෛතික අර්ථයෙන් ගත්විට වත්කම් බැරකම් නීතිය තොරතුරු පනතට වඩා බලවත්ය. තොරතුරු පනත සරල වැඩි ඡන්දයකින් නීතිගත කරගනු ලැබූ නීතියකි. වත්කම් බැරකම් පනත තුනෙන් දෙකේ ඡන්දයකින් සම්මත කරගන්නා ලද නීතියකි. එවැනි බලවත් නීතියක් පවා හොඳින් ක්‍රියා නොකරන තත්ත්වයක තබාගැනීමට හැකිවී ඇත්නම් තොරතුරු පනත ක්‍රියා නොකරන තත්ත්වයක තබාගැනීම ඊට වඩා පහසු වනු ඇත.

වත්කම් බැරකම් නීතිය තමන්ට තිබෙන නිල බලය යොදාගනිමින් අයථා ලෙස වස්තුව උපයා ගැනීමට දේශපාලනඥයන් හා රාජ්‍ය නිලධාරීන් අතර පවතින ප්‍රබල නැඹුරුව දුර්වල කිරීම සඳහා යොදා ගත හැකි ප්‍රබල නීතියකි. පුද්ගලයකු තමන්ගේ වත්කම් හා බැරකම් ප්‍රකාශයක් ලබා දුන් පමණකින් එම ප්‍රකාශය ඔහුගේ ජීවිත කාලය කෙරෙහිම නෛතික ලෙස බලපායි. වත්කම් සැඟවීම සේ ම විකෘති කොට පළකිරීමද දඬුවම් ලැබිය හැකි වරදකි. පුද්ගලයකුගේ වත්කම් බැරකම් ප්‍රකාශ ආකයෙන් ඔහුගේ වත්කම් හා බැරකම් පිළිබඳ අවබෝධයක් ඇති කරගත හැකිය. ඇත්ත තොරතුරු වසන් කිරීමක් සිදුවී ඇත්නම් කවදා හෝ එය හෙළිදරව් වුවහොත් ඔහු ලබාදී තිබෙන වත්කම්

බැරකම් ප්‍රකාශය හේතුවක් කරගනිමින් ඔහුට දඬුවම් කළ හැකිය. වත්කම් බැරකම් ප්‍රකාශය අනුව ඔහු උපයාගෙන ඇති වත්කම් නීත්‍යානුකූලව උපයා ගත් ඒවා නොවන බව පෙනෙන අවස්ථාවකදී ද ඒ ගැන කෙරෙන පරීක්ෂණයකින් පසුව ඔහුට දඬුවම් කළ හැකිය.

වත්කම් බැරකම් ප්‍රකාශයක සහතික පිටපතක් ලබාගැනීම සඳහා රුපියල් 750ක මිලක් සාමාන්‍ය මිනිසකුට දැරිය නොහැකි මිලකි. මේ නීතිය හදන කාලයේ සහතික පිටපතක් ලබාදීමේදී ඡායා පිටපත් ලබාදෙනවා හැරුණු විට ඒවා ලබාදිය හැකි වෙනත් ක්‍රමයක් නොතිබුණි. ඡායා පිටපතක් සඳහා යන මිලද ඒ කාලයේ උපරිම මට්ටමක පැවතුණි. එහෙත් වර්තමාන මිල ගණන් අනුව ඡායා පිටපත්වල මිල තිබෙන්නේ ඉතා පහළ මට්ටමකය. වත්කම් බැරකම් ප්‍රකාශයේ තිබෙන පිටු ගණන පිටු 15කි. පිටු 15ක ලේඛනයක් ඡායා පිටපත් කිරීමට අද වැයවන්නේ රුපියල් 75කටත් වඩා අඩු මුදලකි. එහෙත් අය කරන මිල යන වියදම මෙන් දහගුණයකි.

අවශ්‍ය වෙනස්කම්

මේ නීතියේ උපරිම ක්‍රියාකාරීත්වයක් සඳහා වත්කම් බැරකම් ප්‍රකාශ නිරන්තර මහජන පරීක්ෂාවට ලක් විය යුතුය. නීතිය සකස් කර තිබෙන්නේ එම ධර්මතාවට අනුකූලවය. මේ නීතිය හදන කාලයේ වෙබ් අඩවි ක්‍රමයක් තිබුණේ නැත. මිලක් ගෙවා ඡායා පිටපත් ලබාදෙන ක්‍රමයක් ඇති කර තිබුණේ ඒ නිසාය. එහෙත් දැන් ඒ යල්පැනගිය ක්‍රමයෙන් අත්මිදිය හැකිය. සියලු වත්කම් බැරකම් ප්‍රකාශන ඒ වෙනුවෙන් පවත්වාගෙන යන වෙබ් අඩවියකට යොමු කළ හැකිය. එම වෙබ් අඩවිය පවත්වාගෙන යෑමේ වගකීම අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිසමට හෝ විගණන දෙපාර්තමේන්තුවට ලබාදිය හැකිය. වත්කම් බැරකම් ප්‍රකාශ කිරීම සඳහා තිබෙන පෝරමය විද්‍යුත් පෝරමයක් බවට පත් කළහැකි අතර, දෙපාර්තමේන්තු ප්‍රධානියා තමන්ගේ දෙපාර්තමේන්තු සඳහා ලැබෙන පිරවූ පෝරම වෙබ් අඩවිය පවත්වාගෙන යන බලධාරියා වෙත යොමු කළ හැකිය.

එවිට මහජනයාට කිසිදු මුදල් ගෙවීමකින් තොරව තමන් කැමති පුද්ගලයන්ගේ වත්කම් බැරකම් ප්‍රකාශ පරීක්ෂා කිරීමේ අයිතිය ලැබෙන අතර අයථා ලෙස වත්කම් රැස්කරගෙන සිටින්නවුන් සම්බන්ධයෙන් හා වත්කම් හරියාකාරව ප්‍රකාශ කර නැති අය සම්බන්ධයෙන් අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිසමට ලැබෙන පැමිණිලි සංඛ්‍යාවද ඒ සමග සීඝ්‍ර ලෙස ඉහළ යනු ඇතැයි සිතිය හැකිය. වත්කම් බැරකම් නීතියට ඇති එන්ජිම ප්‍රබල ලෙස ක්‍රියාකරන තත්ත්වයක් ඇතිවනු ඇත්තේ එවිටය.

මෙවැනි වෙනසක් ඇති කිරීම සඳහා පනතට සංශෝධන ඉදිරිපත් කිරීම අවශ්‍ය වන්නේ නැත. වත්කම් බැරකම් ප්‍රකාශ මහජනයාගේ පරීක්ෂාවට ලක්වීමට ඉඩදීම වත්කම් බැරකම් නීතියේ මූලික දර්ශනය වන නිසා එම වෙනස පරිපාලන නියෝගයකින් පමණක් වුවද ඇති කළ හැකිය. පිරවීම සඳහා දෙන පෝරමයද නූතන අවශ්‍යතාවන්ට ගැළපෙන ලෙස යාවත්කාලීන කළ යුතුය. ඒ සඳහා ද පනත සංශෝධනය කිරීමක් අවශ්‍යවන්නේ නැත. වත්කම් බැරකම් නීතියේ භාවිතයට අවශ්‍යතා වෙනස්කම් ඇතිකර ගැනීම සඳහා පුරවැසි ව්‍යාපාරයන් මැදිහත්විය යුතුය.

*රාවය පුවත්පතෙහි පළවූ ලිපියකින් උපුටා ගන්නා ලදි. මෙහි ලේඛකයා එහි උපදේශක කර්තෘ වික්ටර් අයිවන් වන අතර ලිපිය පළකරන අවස්ථාව වන විට ඔහු එහි කතෘවරයා විය. තවද ශ්‍රී ලංකාවේ වත්කම් හා බැරකම් නීතිය ප්‍රායෝගික තලයට ගෙන ඒම සඳහා ඔහු විශිෂ්ඨ සේවයක් සිදුකොට ඇත.*